මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 නොවැම්බර් 04 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 සැප්තැම්බර්

## සමස්ත නිරීක්ෂණ

2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම ඉහළ අගයක පැවතුණු අතර, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනවල කැපී පෙනෙන පහළ යෑම නිරූපණය කරමින්, ආනයන වියදම් අඛණ්ඩව හත්වන මාසයටත් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සුළු වශයෙන් ඉහළ ගියේය. සංචාරක ඉපැයීම් 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2022 සැප්තැම්බර් මාසයේදී වැඩිවීමක් වාර්තා කර ඇත. 2022 සැප්තැම්බර් මාසයේදී රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශ ආයෝජනයන්හි කැපී පෙනෙන ශුද්ධ ලැබීමක් වාර්තා විය. ද්‍රවශීලී දළ නිල සංචිත මට්ටම අඩු වුව ද, අත්‍යවශ්‍ය ආනයන මූල්‍යකරණය සඳහා මහ බැංකුව විදේශ විනිමය ද්‍රවශීලතාව අඛණ්ඩව ලබා දුන්නේය. මේ අතර, අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය මාසය තුළ දී එ.ජ. ඩොලරයට රුපියල් 362ක මට්ටමක පැවතුණි.

### සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2021 සැප්තැම්බර් එ.ජ.ඩො. මිලියන | 2022 සැප්තැම්බර් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2021 ජන. - සැප්. එ.ජ.ඩො. මිලියන | 2022 ජන. -සැප්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,034 | 1,079 | 4.3 | 8,938 | 9,981 | 11.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,526 | 1,284 | -15.8 | 14,938 | 14,085 | -5.7 |
| වෙළඳ ශේෂය | -492 | -206 | | -5,999 | -4,104 | |
| සංචාරක ඉපැයීම් | 35 (ආ) | 54 (ඇ) | 51.8 | 99 (ආ) | 946 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 353 | 359 | 1.7 | 4,577 | 2,574 | -43.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -34 | 41 | | -215 | 138 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 477 | 39 | | 1,906 | 1,798 (ඉ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 1 | 39 | | 16 | 54 | |
| දිගුකාලීන ණය | 166 | ලැ.නො. | | 1,080 | 1,743 (ඉ) | |
| ඒකාබද්ධ ණය පහසුකම | 310 | - | | 810 | - | |
| සමස්ත ශේෂය | | | | -2,573 | -2,927 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2022 අගෝස්තු මාසය දක්වා පමණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ ශේෂය, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 492ක හිඟයට මෙන්ම 2022 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 261ක හිඟයට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 206 ක හිඟයක් වාර්තා කළේය. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,999ක සිට එ.ජ. ඩොලර් මිලියන 4,104ක් දක්වා පහළ ගියේය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟයෙහි මෙම පහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 1.1කින් පහළ ගිය අතර, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2022 වසරේ ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂයමය පදනම මත පහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම**
(අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2 : 2022 වසරේ ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ අපනයන සහ ආනයන ප්‍රධාන උපකාණ්ඩයන්හි වෙනස්වීම**
(අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: මාසික වෙළඳ ශේෂය (2021-2022)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: වෙළඳ මිල අනුපාතය (2021-2022)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,079 දක්වා සියයට 4.3කින් ඉහළ ගියේය.** කෙසේවෙතත්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2022 වසරේ අගෝස්තු මාසයේ අපනයන ආදායමට (එ.ජ. ඩොලර් මිලියන 1,224) වඩා පහළ යෑමක් වාර්තා කළේය. කාර්මික හා කෘෂිකාර්මික අපනයන ඉපැයීම්වල ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, ඛනිජමය අපනයනවල සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා විය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සමුච්චිත පදනම මත අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 9,981 දක්වා සියයට 11.7කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා කාර්මික අපනයනවල සිදු වූ වර්ධනයන් ප්‍රධාන වශයෙන් හේතු විය.

**කාර්මික අපනයන:** 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 4.2කින් ඉහළ ගියේය. ඇඟලුම්, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ යාන්ත්‍රික උපකරණ කොටස්) සහ මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණවලින් ලද ඉහළ අපනයන ආදායම මෙම කාර්මික අපනයන ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. එක්සත් ජනපදය හැර අනෙකුත් බොහෝ ප්‍රධාන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන වර්ධනය විය. විශේෂයෙන්, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මූල ලෝහ හා උපාංග වැනි අනෙකුත් කාර්මික අපනයන කාණ්ඩ බොහොමයක් ද, ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. මීට ප්‍රතිවිරුද්ධව, ඛනිජ තෙල් නිෂ්පාදිත; රබර් නිෂ්පාදිත (මූලික වශයෙන්, රබර් අත්වැසුම්); ආහාර, පාන වර්ග හා දුම්කොළ; මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත; සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිතවලින් ලැබුණු අපනයන ආදායම 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය. සාමාන්‍ය අපනයන මිල ගණන්වල කැපී පෙනෙන ඉහළ යෑමක් පැවතිය ද, නැව් සහ ගුවන් යානා සඳහා සපයන ලද ඉන්ධන පරිමාව පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 44.1ක අඩු වීමක් වාර්තා කළේය.

**කෘෂිකාර්මික අපනයන:** 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 4.5කින් ඉහළ ගිය අතර, මෙම ඉහළ යෑම සඳහා තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ආහාරයට සුදුසු ඇට වර්ග) සහ කුළුබඩු (ප්‍රධාන වශයෙන්, කුරුඳු; සාදික්කා සහ වසාවාසි) ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, සකස් නොකළ දුම්කොළ සහ එළවළු අපනයනයෙන් ලද ආදායම සුළු වශයෙන් ඉහළ ගියේය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ තේ අපනයන පරිමාව වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව පහළ ගියද, තේ අපනයන ඒකක මිල ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස තේ අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වෙතත්, පොල් ආශ්‍රිත නිෂ්පාදිත (මූලික වශයෙන්, පොල් කෙඳි, දිසිදි පොල් සහ පොල්තෙල්), මුහුදු ආහාර (මූලික වශයෙන්, කූනිස්සන් සහ ඉස්සන්) සහ ස්වභාවික රබර් අපනයන ආදායම පහළ ගියේය.

**ඛනිජමය අපනයන:** ප්‍රධාන වශයෙන් අගනා ලෝහ වර්ග අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ ඛනිජමය අපනයන ආදායම සියයට 1.7කින් පහළ ගියේය.

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

**අපනයන දර්ශක:** 2022 වසරේ සැප්තැම්බර් මාසයේ අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන මිල ගණන් ඉහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සියයට 6.7 කින් පහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 11.8කින් ඉහළ ගියේය.

**රූප සටහන 5: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2021 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **808.8** | **842.8** | **4.2** | **6,903.1** | **8,000.6** | **15.9** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 43.7 | 39.8 | -8.9 | 397.7 | 405.8 | 2.0 |
| සත්ත්ව ආහාර | 8.4 | 9.5 | 14.1 | 85.9 | 118.8 | 38.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 458.5 | 481.5 | 5.0 | 3,893.3 | 4,577.2 | 17.6 |
| එයින්, ඇඟලුම් | 421.7 | 442.8 | 5.0 | 3,544.3 | 4,215.9 | 18.9 |
| රෙදිපිළි | 27.3 | 29.6 | 8.3 | 254.8 | 270.5 | 6.2 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.4 | 9.2 | -3.0 | 94.2 | 90.7 | -3.7 |
| රබර් නිෂ්පාදිත | 90.9 | 78.9 | -13.2 | 772.6 | 755.1 | -2.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.5 | 46.9 | 129.1 | 199.5 | 325.7 | 63.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 37.4 | 52.0 | 38.9 | 366.5 | 427.9 | 16.7 |
| ප්‍රවාහන උපකරණ | 8.5 | 9.2 | 8.0 | 83.3 | 98.6 | 18.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 53.7 | 30.0 | -44.1 | 348.6 | 439.9 | 26.2 |
| රසායනික නිෂ්පාදිත | 19.2 | 20.6 | 7.2 | 162.9 | 171.4 | 5.2 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.2 | 11.5 | 13.3 | 92.8 | 107.3 | 15.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.6 | 1.5 | -67.5 | 40.1 | 39.4 | -1.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.5 | 9.4 | 70.1 | 39.3 | 63.6 | 61.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.5 | 5.5 | -15.0 | 57.2 | 48.8 | -14.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 11.2 | 14.4 | 28.1 | 111.3 | 134.6 | 20.9 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 3.1 | 3.7 | 20.8 | 27.8 | 29.7 | 6.8 |
| වෙනත් කාර්මික අපනයන | 26.8 | 28.2 | 5.1 | 224.3 | 256.9 | 14.6 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **221.2** | **231.2** | **4.5** | **1,986.7** | **1,939.8** | **-2.4** |
| තේ | 104.1 | 117.8 | 13.2 | 986.6 | 937.1 | -5.0 |
| රබර් | 5.2 | 3.3 | -36.1 | 32.5 | 32.7 | 0.9 |
| පොල් | 35.8 | 29.7 | -17.1 | 312.7 | 314.0 | 0.4 |
| කුළුබඩු | 37.3 | 40.6 | 8.8 | 319.6 | 274.1 | -14.3 |
| එළවළු | 1.9 | 2.3 | 21.7 | 20.3 | 19.8 | -2.1 |
| සකස් නොකළ දුම්කොළ | 1.1 | 2.1 | 88.8 | 22.5 | 17.8 | -21.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.3 | 18.6 | 39.7 | 104.4 | 138.9 | 33.0 |
| මුහුදු ආහාර | 22.6 | 17.0 | -24.9 | 188.1 | 205.3 | 9.2 |
| **3. ඛනිජ අපනයන** | **3.1** | **3.0** | **-1.7** | **33.8** | **24.1** | **-28.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.4** | **1.8** | **35.4** | **14.9** | **16.6** | **11.2** |
| **මුළු අපනයන** | **1,034.5** | **1,078.9** | **4.3** | **8,938.5** | **9,981.1** | **11.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,526ට සහ 2022 වසරේ අගෝස්තු මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,486ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,284 දක්වා සියයට 15.8කින් පහළ ගියේය**. ප්‍රධාන වශයෙන් ආනයන සීමා කිරීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන්, ආයෝජන භාණ්ඩ සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදමෙහි පහළ යෑමක් පෙන්නුම් කළේය. කෙසේ වුවත්, අන්තර් භාණ්ඩ සහ ආහාර හා පාන වර්ග ආනයනවල ඉහළ යෑමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ආනයන වියදම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 14,938ට සාපේක්ෂව එ.ජ ඩොලර් මිලියන 14,085ක් විය.

**පාරිභෝගික භාණ්ඩ:** 2022 සැප්තැම්බර් මාසයේ දී ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 35.3කින් පහළ ගියේය. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, පදනම් බලපෑම මත එන්නත් ආනයන වියදම අඩුවීම), විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන) සහ ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන්, රූපවාහිනී) ආනයන කැපී පෙනෙන ලෙස  පහළ ගිය අතර, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සියලුම උපකාණ්ඩවල ආනයන වියදමෙහි පහළ යෑමක් පෙන්නුම් කළේය. මේ අතර, ප්‍රධාන වශයෙන් සීනි සහ ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදිත (මූලික වශයෙන්, සහල්) ආනයන පරිමාව ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ආහාර සහ පාන වර්ග ආනයනය මත වියදම සියයට 10.7කින් ඉහළ ගියේය. තවද, කුළුබඩු සහ පාන වර්ග ආනයන ද යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, කිරිපිටි), තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන්, පොල්තෙල්), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, කරවල), පලතුරු සහ එළවළු සඳහා වන ආනයන වියදම, ප්‍රධාන වශයෙන් ඒවායේ ආනයන පරිමාවන් පහළ යෑම හේතුවෙන් 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව පහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** ඉන්ධන ආනයන වියදමෙන් ලද දායකත්වය විශාල වශයෙන් ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 7.7කින් ඉහළ ගියේය. 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පරිමාවන් සහ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් බොර තෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරුවලින් සමන්විත ඉන්ධන ආනයන වියදම, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 87.3කින් ඉහළ ගියේය. 2022 වසරේ ජූනි මාසයේ සිට ගල් අඟුරු ආනයන පරිමාව අඛණ්ඩව අඩු මට්ටම්වල පැවතුණි. තවද, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී දියමන්ති සහ අගනා ගල් වර්ග සහ ලෝහ වර්ග (මූලික වශයෙන්, කාර්මික කටයුතු සඳහා යොදා ගන්නා දියමන්ති) සහ පොහොර (මූලික වශයෙන්, යූරියා) ආනයන වියදම් 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ), රෙදිපිළි සහ රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, රෙදි වර්ග), රථවාහන හා යන්ත්‍රෝපකරණ කොටස් (ප්‍රධාන වශයෙන්, රථවාහන කොටස්), ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන්, මේදය හා තෙල් වර්ග), තිරිඟු සහ ඉරිඟු ඇතුළු තවත් බොහෝ අන්තර් භාණ්ඩවල කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා විය.

---

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.
.

**ආයෝජන භාණ්ඩ:**, සියලුම උපකාණ්ඩවල ආනයන වියදම්හි පහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 53.7කින් පහළ ගියේය. සම්ප්‍රේෂණ උපකරණ සහ පරිගණක ආනයන වියදම පහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදමෙහි කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා විය. ප්‍රධාන වශයෙන් යකඩ සහ වානේ (මූලික වශයෙන්, යකඩ දඬු හා සහ යකඩ කූරු) සහ යකඩ සහ වානේ උපාංග ආනයන පහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ආනයන වියදම් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් දුම්රිය උපකරණ ආනයන පහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයනය මත වූ වියදම පහළ ගියේය.

**ආනයන දර්ශක:** 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආනයන පරිමාව හේතු වූ බව නිරූපණය කරමින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සියයට 25.6කින් පහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 13.1කින් ඉහළ ගියේය.

**රූප සටහන 8: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 9: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 10: මාසික ආනයන ඒකක මිල දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2021 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **310.7** | **201.1** | **-35.3** | **2,890.0** | **2,146.7** | **-25.7** |
| ආහාර හා පාන වර්ග | 109.8 | 121.5 | 10.7 | 1,261.7 | 1,227.7 | -2.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.0 | 30.0 | 887.5 | 27.4 | 315.4 | 1,049.7 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 39.4 | 9.5 | -75.9 | 270.6 | 184.1 | -32.0 |
| එළවළු (ආ) | 23.9 | 23.5 | -1.7 | 302.6 | 249.7 | -17.5 |
| මුහුදු ආහාර | 9.5 | 3.7 | -61.0 | 92.0 | 53.0 | -42.4 |
| සීනි හා රසකැවිලි | 3.4 | 31.8 | 829.7 | 214.7 | 180.6 | -15.9 |
| කුළුබඩු | 7.9 | 11.7 | 48.6 | 98.4 | 104.9 | 6.6 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.5 | 11.3 | -49.9 | 255.8 | 140.0 | -45.3 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 201.0 | 79.6 | -60.4 | 1,628.3 | 919.0 | -43.6 |
| පෞද්ගලික රථවාහන | 2.1 | 0.7 | -64.4 | 9.9 | 6.5 | -34.5 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 108.7 | 44.5 | -59.0 | 640.7 | 392.0 | -38.8 |
| ගෘහ උපකරණ | 15.0 | 4.1 | -72.6 | 194.8 | 75.4 | -61.3 |
| රෙදිපිළි හා උපාංග | 18.1 | 11.3 | -37.4 | 156.8 | 169.9 | 8.4 |
| විදුලි සංදේශ උපකරණ | 24.1 | 4.1 | -82.9 | 307.2 | 54.0 | -82.4 |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.5 | 5.6 | -61.3 | 118.1 | 92.5 | -21.7 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 18.4 | 9.1 | -50.6 | 200.8 | 128.7 | -35.9 |
| **2. අන්තර් භාණ්ඩ** | **848.4** | **913.4** | **7.7** | **8,790.8** | **9,497.4** | **8.0** |
| ඉන්ධන | 201.0 | 376.4 | 87.3 | 2,596.8 | 3,694.3 | 42.3 |
| එයින්, බොරතෙල් | - | 85.6 | - | 516.4 | 342.9 | -33.6 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 163.0 | 290.0 | 77.9 | 1,911.3 | 3,086.0 | 61.5 |
| ගල්අඟුරු | 37.9 | 0.8 | -97.9 | 169.1 | 265.4 | 56.9 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 12.4 | 23.6 | 90.1 | 94.1 | 157.2 | 67.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 262.2 | 231.5 | -11.7 | 2,205.9 | 2,407.2 | 9.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 36.1 | 35.1 | -2.5 | 355.5 | 360.6 | 1.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 17.5 | 13.4 | -23.7 | 204.8 | 161.7 | -21.1 |
| තිරිඟු හා ඉරිඟු | 25.5 | 18.2 | -28.5 | 291.4 | 188.5 | -35.3 |
| මූල ලෝහ | 66.9 | 12.7 | -81.0 | 566.1 | 282.7 | -50.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 52.2 | 49.4 | -5.3 | 570.8 | 514.3 | -9.9 |
| රසායනික නිෂ්පාදිත | 78.6 | 74.1 | -5.7 | 811.2 | 756.2 | -6.8 |
| පොහොර | 0.4 | 6.3 | 1,373.4 | 104.4 | 104.5 | 0.1 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 24.8 | 26.6 | 7.2 | 290.6 | 284.2 | -2.2 |
| ඛනිජ නිෂ්පාදිත | 8.7 | 4.4 | -49.6 | 114.8 | 106.8 | -6.9 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 62.1 | 41.5 | -33.1 | 584.5 | 479.1 | -18.0 |
| **3. ආයෝජන භාණ්ඩ** | **366.5** | **169.5** | **-53.7** | **3,248.8** | **2,433.0** | **-25.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 226.8 | 108.3 | -52.3 | 2,049.4 | 1,570.7 | -23.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 96.5 | 57.9 | -40.0 | 900.5 | 747.1 | -17.0 |
| ප්‍රවාහන උපකරණ | 42.5 | 3.3 | -92.2 | 294.6 | 112.5 | -61.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.6 | 0.05 | -91.6 | 4.3 | 2.7 | -36.2 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **0.3** | **-14.8** | **8.0** | **8.1** | **1.4** |
| **මුළු ආනයන** | **1,526.0** | **1,284.4** | **-15.8** | **14,937.5** | **14,085.2** | **-5.7** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,325.1** | **907.9** | **-31.5** | **12,340.7** | **10,390.9** | **-15.8** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය ජංගම ගිණුමේ වාර්තා වූ අනෙකුත් ප්‍රධාන වර්ධනයන්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2022 වසරේ අගෝස්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 325ට සාපේක්ෂව 2022 වසරේ මේ දක්වා ඉහළම මාසික ප්‍රේෂණ ප්‍රමාණය වාර්තා කරමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 359ක් දක්වා වැඩි විය. මේ අතර, 2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 30,084ක් ලෙස වාර්තා වූ අතර, එය නුපුහුණු (10,491), පුහුණු (9,391) සහ ගෘහ සේවිකා (7,027) යන කාණ්ඩවලින් සමන්විත විය. 2022 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලය තුළ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු පිටවීම් 222,678ක් ලෙස වාර්තා වී ඇති අතර එය පූර්ව වසංගතයේ වාර්ෂික පිටත්වීම් ඉක්මවා ඇත.

**සංචාරක පැමිණීම්:** 2022 වසරේ අගෝස්තු මාසයේ වාර්තා වූ 37,760ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 29,802ක් දක්වා මධ්‍යස්ථ විය. 2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා වූ රටවල් ලෙස ඉන්දියාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සහ ජර්මනිය පැවතුණි. 2022 වසරේ අගෝස්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 68ක් සහ පෙර වසරේ සැප්තැම්බර් මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 35ට සාපේක්ෂව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 54ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 11: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 12: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන සැලකිය යුතු ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2022 වසරේ ජනවාරි-සැප්තැම්බර් දක්වා කාලය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 44ක සමුච්චිත ශුද්ධ ලැබීමක් විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශ ලැබීම්වල සැලකිය යුතු ශුද්ධ ලැබීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 138ක විදේශීය ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2022 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.8ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.4කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. මහ බැංකුව දළ නිල සංචිතවලට ගලා ඒම් උපයෝගී කර ගනිමින් අත්‍යවශ්‍ය ආනයන මූල්‍යකරණය කිරීම සඳහා විදේශ විනිමය ද්‍රවශීලතාව අඛණ්ඩව සැපයීම සිදු කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ද්‍රවශීලි සංචිත මට්ටම සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතී. දළ නිල සංචිත හා බැංකු අංශයේ දළ විදේශීය වත්කම් වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2022 වසරේ සැප්තැම්බර් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.0ක් විය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**2022 වසරේ මැයි මස මැද දී දෛනික විචලන පරාසය හඳුන්වා දීමෙන් පසුව, සමස්ථයක් ලෙස 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී විනිමය අනුපාතිකය අඛණ්ඩව ස්ථාවරව පැවතුණි.** ඒ අනුව, 2022 වසරේ නොවැම්බර් මස 04වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.9ක අවප්‍රමාණයක් වාර්තා කළද, 2022 වසරේ මැයි මස 13 සිට මේ දක්වා, එය එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කර ඇත. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ නොවැම්බර් මස 04වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලරයට සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම ***

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (නොවැම්බර් 04 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -44.9% |
| යූරෝ | -11.2% | +1.1% | -36.1% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -33.5% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -29.0% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | -36.6% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -38.7% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.- සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.- සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **223.9** | **238.1** | **6.4** | **2,019.5** | **2,024.6** | **0.3** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 24.9 | 18.7 | -24.8 | 216.6 | 229.7 | 6.0 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.0 | 6.9 | 14.5 | 50.2 | 57.6 | 14.8 |
| 05 එළවළු හා පලතුරු | 38.9 | 38.6 | -0.6 | 338.0 | 350.7 | 3.7 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 139.9 | 156.5 | 11.9 | 1,278.6 | 1,196.2 | -6.4 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **9.3** | **11.0** | **18.7** | **99.2** | **104.5** | **5.3** |
| 11 පාන වර්ග | 2.6 | 4.0 | 51.3 | 23.0 | 37.3 | 62.0 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 7.0 | 5.7 | 76.2 | 67.2 | -11.8 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **37.5** | **33.9** | **-9.6** | **322.0** | **337.7** | **4.9** |
| 23 සකස් නොකළ රබර් | 5.2 | 3.4 | -35.0 | 33.2 | 33.6 | 1.3 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 20.2 | 16.2 | -19.5 | 180.6 | 178.7 | -1.0 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **53.7** | **30.0** | **-44.1** | **348.6** | **439.9** | **26.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 53.7 | 30.0 | -44.1 | 311.7 | 424.0 | 36.0 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | 36.9 | 15.9 | -56.9 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **9.8** | **5.4** | **-44.6** | **92.9** | **74.3** | **-20.0** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 6.9 | 5.4 | -21.8 | 61.6 | 61.0 | -1.1 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **24.1** | **25.6** | **6.0** | **211.9** | **210.1** | **-0.9** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **133.3** | **163.6** | **22.7** | **1,229.6** | **1,425.4** | **15.9** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 58.1 | 55.3 | -4.9 | 497.4 | 527.2 | 6.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 34.0 | 37.2 | 9.4 | 331.7 | 345.2 | 4.1 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 24.5 | 51.7 | 110.8 | 241.9 | 371.9 | 53.8 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **43.7** | **59.6** | **36.4** | **436.6** | **512.4** | **17.4** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 22.3 | 32.7 | 47.1 | 234.9 | 269.0 | 14.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **498.6** | **511.5** | **2.6** | **4,177.5** | **4,851.5** | **16.1** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 458.2 | 472.3 | 3.1 | 3,847.0 | 4,480.0 | 16.5 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.4** | **0.03** | **-94.4** | **0.8** | **0.8** | **3.4** |
| **මුළු අපනයන** | **1,034.5** | **1,078.9** | **4.3** | **8,938.5** | **9,981.1** | **11.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2022 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.- සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **ර0. ආහාර හා සජීවී සතුන්** | **151.3** | **155.4** | **2.7** | **1,685.3** | **1,602.0** | **-4.9** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 39.4 | 9.5 | -75.9 | 270.9 | 184.4 | -31.9 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 9.7 | 3.8 | -60.4 | 92.9 | 54.0 | -41.8 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 28.6 | 47.8 | 67.5 | 317.1 | 500.0 | 57.7 |
| 05 එළවළු හා පලතුරු | 28.2 | 26.2 | -7.0 | 352.2 | 286.2 | -18.7 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 3.4 | 31.8 | 829.5 | 214.7 | 180.6 | -15.9 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.2 | 14.5 | 19.1 | 129.3 | 136.6 | 5.6 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **5.8** | **10.7** | **83.0** | **56.9** | **76.0** | **33.7** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **39.8** | **34.8** | **-12.6** | **420.3** | **381.8** | **-9.2** |
| 23 සකස් නොකළ රබර් | 21.2 | 22.6 | 6.3 | 255.1 | 242.6 | -4.9 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 1.5 | 2.6 | 78.4 | 16.0 | 21.5 | 34.5 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **200.9** | **376.4** | **87.3** | **2,596.8** | **3,694.3** | **42.3** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 137.9 | 351.4 | 154.8 | 2,168.6 | 3,244.3 | 49.6 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 25.1 | 24.2 | -3.5 | 259.1 | 184.7 | -28.7 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **19.1** | **3.2** | **-83.4** | **230.3** | **65.2** | **-71.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 18.1 | 2.4 | -87.0 | 212.3 | 53.4 | -74.9 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **236.4** | **171.8** | **-27.3** | **2,096.8** | **1,742.8** | **-16.9** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 104.2 | 43.1 | -58.7 | 595.5 | 369.4 | -38.0 |
| 56 පොහොර | 0.4 | 6.3 | 1,368.5 | 103.9 | 104.3 | 0.4 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 37.1 | 29.8 | -19.7 | 419.1 | 351.5 | -16.1 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 12.3 | 16.5 | 35.0 | 124.3 | 133.9 | 7.7 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **485.2** | **359.3** | **-25.9** | **4,272.5** | **4,066.5** | **-4.8** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 32.0 | 32.0 | 0.2 | 337.4 | 337.4 | 0.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 259.7 | 223.5 | -13.9 | 2,167.2 | 2,355.1 | 8.7 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 41.5 | 39.8 | -4.2 | 378.5 | 392.3 | 3.6 |
| 67 යකඩ හා වානේ | 78.7 | 17.5 | -77.8 | 691.2 | 392.3 | -43.2 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **309.6** | **119.3** | **-61.5** | **2,872.6** | **1,833.1** | **-36.2** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 51.0 | 17.6 | -65.5 | 486.5 | 324.5 | -33.3 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 43.1 | 20.5 | -52.4 | 456.9 | 353.5 | -22.6 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 30.7 | 9.9 | -67.9 | 249.4 | 133.5 | -46.5 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 65.4 | 12.0 | -81.7 | 609.0 | 182.6 | -70.0 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 52.5 | 44.8 | -14.8 | 538.0 | 504.8 | -6.2 |
| 78 රථවාහන | 24.5 | 6.1 | -75.0 | 263.4 | 127.5 | -51.6 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **77.6** | **53.0** | **-31.7** | **696.9** | **613.8** | **-11.9** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 17.1 | 11.6 | -32.2 | 134.3 | 150.5 | 12.1 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 21.7 | 8.5 | -61.0 | 178.9 | 111.6 | -37.6 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.3** | **0.5** | **47.5** | **9.1** | **9.6** | **6.3** |
| **මුළු ආනයන** | **1,526.0** | **1,284.4** | **-15.8** | **14,937.5** | **14,085.2** | **-5.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf